10 වන පිටෙන්

විශ්ව විද්‍යාල සිසුන් කිහිප දෙනෙක් නිදහස් කළා ඒ ලැයිස්තුවට මාත් සිටිය. එදා මා අහම්බෙන් ජීවිතය බේරාගත්ත. මගේ ජීවිතය බේරගන්න උදව් කරපු පේරාදෙණිය විශ්ව විද්‍යාලෙ බන්දුල දිසානායක සහෝදරයත් පසුව ඝාතනය වුණා. අන්තිමට ඒ ලැයිස්තුවෙන් ඉතිරි වුණෙ මං විතරයි.

**එදා ඔප්පු කළ නොහැකි ක්‍රියාකාරකම් පෙන්වමින්, ඔබ නොකළ වීරකම් උළුප්පා දක්වමින්, ඔබව වීරයෙක් බවට පත්කරන්නට මාධ්‍යය උත්සහ කරන බව දිවයින පුවත්පතේ සී ප්‍රේමචන්ද්‍ර පවසා තිබුණා. ඒ පිළිබඳව ඔබේ අදහස ?**

එදා 87, 89 වකවානුවේ සමාජය ප්‍රචණ්ඩයි. එසේ ප්‍රචණ්ඩ වුනේ ජේ.ආර්. රජය විසින් නව ලිබරල් ධනවාදෙය් පළමු ඉනිම පටන් ගනිමින් දියත් කල වර්ධන රැල්ලයි. ප්‍රජාතන්ත්‍රවාදී අරමුණු හා අයිතිවාසිකම් දිනාගැනීමේ සටනට අපිත් හවුල් වුණා. අපි ඒ අරමුණ වෙනුවෙන් සටන් කළා. මට දේශපාලනය කරලා වීරයෙක් වෙමින් පුද්ගල අනන්‍යතාවක් ගොඩනගාගන්න වුවමනාවක් නැහැ. පක්ෂය වෙනුවෙන් පොළොවට පස්වුණු සහෝ දරයන්ගේ ලේ මතින් මට දේශපාලන වීරයෙක් වෙන්න අවශ්‍ය නැහැ. ඒවා අනාගතයේදි රටෙ ජනතාව තීරණය කරයි. පටු අරමුණු හා මුදල්වලට මාධ්‍ය හා පත්තර පිටු පුරවන මාධ්‍යවේදීන් යයි කියාගන්නා පුද්ගලයන්ට

*කිරීමට දඟලන මෙවැනි මාධ්‍යවේදීන් ට රජය මුදල් වියදම් කරනවා. අප රටේ විශාල ප්‍රශ්ණයකට සංවාදයකට ලක්වන්න තියෙන කරුණු කාරණා අමතක කොට අද ඔවුන් කතා කරන්නේ අතුරුදහන් වී පණ බේරාගත් ශ්‍රී ලාංකිකයෙකුගේ වදහිංසා බොරු බව.*

ඕනම දෙයක් ලියන්න කරන්න පුළුවන්.

**ඔබව එල් ටී ටී ඩයස්පෝරාව සමඟ සම්බධකම් පවත්වන බවත් පක්ෂයට ලැබෙන අරමුදල් එල් ටී ටී ආධාර බවටත් ඇතැමුන් පවසන කාරණා සම්බන්ධයෙන් ඔබේ පිළිතුර?**

විප්ලවවාදී සන්නද්ධ අරගලය අතහැරල ප්‍රජාතන්ත්‍රවාදී අරමුණු සපිරි සමාජවාදී ගමනක් තෝරාගත්. නැවත ජනතාව අතර ජීවත් වුණු අප පක්ෂයේ නිර්මාතෘ විජේවීර සහෝදරයට එදා 83 කලබල හා නැක්ස්ලයිට් කුමන්ත්‍රණය පිට වරද පටවල, ඔහුට හැංගෙන්න මග පාදපු ජේ. ආර්. ප්‍රේමදාස රජය ඔහුව විනාශ කරල දැම්මේ කිසිම වග විබාගයක් නැතිව. අදත් එහෙමයි. ඔවුන් නැති ප්‍රශ්න ඇති කරමින් අපිව දඩමීමා කරගන්න උත්සහ කරන්නේ අනාගතේ මුහුණ දෙන්න වෙන්න ජනතා අරගලවලට බියේ. මගේ නම අගට අල්මයන්නක් තිබුණ එකත් ඔවුන් ප්‍රශ්නයක්. මම සිංහල කතා කරන සිංහල දෙමළ ජනතාව අතර ජීවත් වන ජාතිවාදය ප්‍රතික්ෂේප කරන වාම වාදියෙක්. අද එල්ටීටී ය විනාශ කර එහෙත් සමහර විදේශ එල්ටීටී නායකයන් රජය ඇතුලෙ තියාගෙන එම මුදල්වලින් යැපෙන්න උත්සහ කරන්නෙ රජයයි. එල්ටීටී මුදල්වලින් පක්ෂය ගොඩනගන්න අපට වුවමනාවක් නැහැ. එය සමාජවාදී වාමවාදී පක්ෂයක්. එල්ටීටීය සමාජවාදය තෝරගත් සංවිධානයක් නොවෙයි.

**ඔබට ලිංගික වද හිංසා දුන් බව පවසන්නේ මෙවැනි රටක පුරවැසිකම රැකගන්නට බව එම මාධ්‍යවේදියාට පවසා තිබුණා. එයට පිළිතුර?**

ලසන්ත වික්‍රමතුංග මහමඟ ඝාතනය වුණා. අද වනතුරු ඝාතකයො නැහැ. එක්නැලිගොඩ අතුරුදහන්. ලලිත් සහ කුගන් සහෝදරවරු අද වනතතුරු හොයාගන්න නැහැ. සත්‍යය දකින මාධ්‍යවේදීන් විනාශ කරනව මෙවැනි බරපතල කාරණා සංවාදයකට ලක්වන්නට තිබෙද්දි එහි චූදිතයන් රජයම බව ඔප්පු වී තිබෙද්දි, රජයේ නිල යාන්ත්‍රණය ක්‍රියාත්මක කරමින් හමුදාවට පොලිසියට බොරු පොරොන්දු ලබාදෙමින්, තමන්ගේ යටි අරමුණු ඉෂ්ට කිරීමට දඟලන මෙවැනි මාධ්‍යවේදීන් ට රජය මුදල් වියදම් කරනවා. අප රටේ විශාල ප්‍රශ්ණයකට සංවාදයකට ලක්වන්න තියෙන කරුණු කාරණා අමතක කොට අද ඔවුන් කතා කරන්නේ අතුරුදහන් වී පණ බේරාගත් ශ්‍රී ලාංකිකයෙකුගේ වදහිංසා බොරු බව. මට රැකගන්න අවශ්‍ය පුරවැසිකමක් නැහැ. දැන් මං ශ්‍රී ලාංකිකයෙකු වූ මෙරට පුරවැසියෙක්. අපරටේ අතුරුදහන් වී වදහිංසා වලට ලක් නොවුණු පුද්ගලයෙක් ඉන්නවනම් ඔහුට හැකිද ඒ බව ඔප්පු කරන්න. අපරටේ බරපතල සංවාද කොන්ක්‍රීට්වලින් වසා ඔවුන් මේ කරන්නෙ සෙල්ලමක්.

**මෙවැනි ධනේෂ්වර හා විවෘත ආර්ථික ප්‍රතිපත්තියන් අනුගමනය කරන ඕස්ට්‍රේලියා වැනි රටක තාවකාලිකව හෝ ජීවත්වන ඔබට, එහි ප්‍රතිඵල උපරිමයෙන් භුක්ති විඳින ජනතාවක් සිටින රටක ජීවත් වන ඔබට මාක්ස්වාදය ලෝකයේ තවදුරටත් වලංගු දේශපාලන ක්‍රමයක් යැයි සිතිය හැකිද ?**

ඇත්තෙන්ම ඒ ප්‍රශ්නය ගැඹුරින් සළකා බැලිය යුතු කරුණක්. සමාජවාදය යථාර්තයක් කළ හැකියි. මෙවැනි රටක ජීවත් වන කොට තමයි හිතෙන්නෙ ඒ අත්දැකීම් ලබන කොට තමයි හිතෙන්නෙ සමාජවාදය නිර්මාණය කළ හැකියි කියල. ධනේෂ්වර ක්‍රමයක් මතින් තමයි සමාජවාදය ගොඩනැගිය හැක්කෙ. මාක්ස් වුනත් මුලින් හිතුවෙ මුලින්ම බටහිර රටවලින් තමයි සමාජවාදය බිහිවෙන්නෙ කියල. අද ලෝකය තුළම ධනවාදයේ ප්‍රශ්න තියෙනව. අර්බුද ගොඩනැගිල තියෙනව. ධනවාදය තුල ආර්ථික අර්බුදය පාලනය කරන්න බැහැ. අද එය අවුල් වෙලා තියෙනව. අද ධනේෂ්වර රටවල් තුල ඒ අර්බුදය ව්‍යාප්ත වෙමින් පවතිනව. මිනිසුන් අරගල කරන්නෙ, සටන් කරන්නෙ ඒ අරමුණු දිනාගන්න. ඒක එකවරම ලබාගත නොහැකි හෙමින් යා යුතු ගමනක්.

**ඔබ මෙවැනි රටක ජීවත්වන කුමාර සැප විඳින විප්ලවවාදී නායකයකු බව කලක් ඔබ පක්ෂයේම සිටි පිරිස් පවසනවා. ඒ පිළිබඳව ඔබේ අදහස**

දිවා රෑ නිදවරමින් ශ්‍රමය දිය කරමින්, ගෙවල් කුලී අධ්‍යාපනය ආදී සියලු දේවල් වලට මුදල් ගෙවාදමමින් අප ගෙවන කුමාර දිවිය ගැන මෙහි ජීවත්වන ඔබට අමුතුවෙන් කියාදෙන්න අවශ්‍ය නැහැ. අපි නෙවෙයි කුමාර සැප විඳින්නේ ඔවුන්. අපි නිර්මාණය කළ පක්ෂයෙන් පාර්ලිමේන්තුවට ගිය බොහෝ මන්ත්‍රීවරු ජනතාව සමඟ මහපාරේ බස් එකේ කෝච්චියෙ යනවද? ඔවුන් වාහන බලපත්‍ර ලබාගනිමින් මහා ජාවාරම් කරමින්, ජනතාවගෙන් ඈත්වෙමින් කුස අතපය පිම්බුණ කඳමස් පිරුණු පුද්ගලයන් බවට පත්වෙල. එදා සම සමාජය කොමියුනිස් පක්ෂයේ හිටපු වමේ නායකයන් ලඟ තිබුණු අල්පේච්ඡතාවක්වත් ඔවුන් ලඟ තියෙනවද? ඔවුන් මිල මුදල් හම්බකරන දූෂණ දේශපාලකයන් බවට පත්වෙලා. එදා වම විවේචනය කළ අප නායකයන් අද ඔවුන් තරම්වත් අවංකද ? එලෙසම අප රටේ පාලකයන් කරන කරල ඇති වැරදි වලින් අංශු මාත්‍රයක තරම්වත් වැරැද්දක් මං කරල නැහැ. අද ආණ්ඩුවෙම හිටපු දේශපාලන නායකයකුගේ දුවක් ප්‍රජාතන්ත්‍රවාදී නිදහස අසාධාරණය හා අව නීතිය වෙනුවෙන් සටන් කරනවා. කප්පම් පැහැරගැනීම් මැද ජනතාව මැද පන්තියේ ව්‍යාපාරිකයන් බිය ගන්වල මුදල් මංකොල්ල කනවා. කුඩු කාරයො, රජයේම මිනීමරපු මන්ත්‍රීවරු මේ ගුවන් ගමන් ගේට්ටුවෙන්ම පිටරටවලට ගිහිල්ල සැඟවිල ඉන්නව. පුරාවස්තු මංකොල්ල කනව. අවංකව දේශපාලනය කිරීම වරදක්ද ?

**ඔබගේ හඳහන හා ජ්‍යොතිෂය ගැන මෑතකදී පුවත් පතක කියා තිබුණේ ඔබගේ අපල ගැන. ඔබගේ හඳහන ඔවුන් අතට ගියේ කෙලෙසද ?**

ඇත්තෙන්ම ඒ බොරු ප්‍රලාප. මාක්ස්වාදය විශ්වාස කරන මා හඳහන් පිළිබඳ විශ්වාසයක් නැහැ. මට හඳහනක් තියනවද කියලවත් මං දන්නෙ නැහැ මට මන්ත්‍රීවරයෙක් වෙන්න අවශ්‍යතාවක් තිබුණානම් එය සිදුවන්න තිබුනෙ 1994 දී. මට තනතුරු අවශ්‍ය නැහැ. අවශ්‍ය ජනතාවට සේවය කිරීමයි. එම ගමන මෙවැනි පැහැර ගැනීම්වලින් නවත්වන්න බැහැ. ■


# IMMIGRATION @ IMMIGRATION LAWYERS

## FAIRFIELDS

IMMIGRATION LAWYERS - MELBOURNE

Our team of Specialist Lawyers, Barristers and Registered Migration Agents in Melbourne competently assisted many Sri Lankans, South Asians and many other nationalities and Australian Companies in the following areas of Migration matters over 14 years.

- General Skill Migration Permanent Residence
- General Skill Migration Provisional Residence
- Second stage Skilled Regional (Permanent Residence)
- State Sponsored Skill Migration
- Graduate Skill Temporary visas
- Complex Student visas
- 457 Visas
- Employer Nominations (ENS)
- Employer Contracts
- Negotiations of employer nominations with the Australian Employers
- Regional Sponsored Migration Scheme (RSMS)
- Skill Assessments
- State Sponsorships
- TRA cancellations
- Criminal Prosecutions on TRA cancellations
- Student Visa Cancellations
- Permanent residence Cancelations
- Appeals to the Migration Review Tribunal (MRT)
- Administrative Review Tribunal (AAT)
- Business Migration State Sponsorships
- Business Migration visas
- Spouse & visas
- Aged Parent visas
- Contributory Parent visas
- Resident Return visas
- Australian Citizenships

GLISS DESIGN



Our Team:

LAW INSTITUTE OF VICTORIA SPECIALIST ACCREDITATION

**Susantha Katugampala** LL B (Monash)
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

**Michael Gros** LL B (Monash)
Consulting Barrister
MARN: 9803398

**Al Noveloso**
Migration Consultant
MARN: 0849632

**Frank Sabelberg** LL B (Monash)
Consulting Solicitor
MARN: 0004726

**Lindy Noone**
Migration Consultant
MARN: 0322507

Sri Lanka
AUSTRALIA GATEWAY
Australian Migration Consultants
Hilton Colombo Towers
200 Union Place Colombo 02
Telephone: +94 11 2300 627
+94 777 347 670

Australia
FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE
10, Morrison Place
East Melbourne Victoria 3002
Telephone: +61 3 9650 4557
Interstate Callers: 1300 888 331
Fax: +61 3 9650 4559

E: info@fairfieldslawyers.com Mobile: 0430 699 961 or 0419 863 771

**We Deliver Results..**